ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2024

**නීති හා කොන්දේසි**

1. අයදුම්පත් ඉදිරිපත්කිරිමේදී 2023 වසර සඳහා සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ

සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.

2. එක් අයිත්මයකට වඩා ලියාපදිංචි වීමට කැමති නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල

යුතුය. ඒ සෑම එකක් සඳහාම ආපසු නොගෙවන රු. 2000.00 ක තැම්පතුවක් තැබිය යුතුය.

3. ලියාපදිංචි වීමට කැමති නම් ඔබ ගණුපදනු කරනු ලබන බැංකුවේ නම සහ ගිණුම් අංකය

අයදුම්පතෙහි සඳහන් කල යුතුය.

4. ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැදවන නමුත් අවශ්‍ය

අවස්ථාවන්හි වෙනත් සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැදවා භාණ්ඩ ලබා ගැනීමේ බලය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සතු වේ.

5. අධිකාරියට ණය පදනම මත දෙනු ලබන ප්‍රමාණය හා කාල සීමාව අයදුම් පතෙහි සඳහන්

කල යුතුය.

6. භාණ්ඩ හා සේවාවන් නියමිත ප්‍රමිතියට අනුකූලව නියමිත වෙලාවට සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත් කරුවන්ගේ නම් ලියාපදිංචි ලැයිස්තුවෙන් කිසිඳු දැනුම්දීමකින් තොරව කපා හරිනු ලැබේ.

7. ගරාජය / සේවා ස්ථානය රක්ෂණය කර තිබීම අනිවාර්ය වන අතර සේවාවන් සඳහා

පැමිණෙන වාහන සඳහාද එම රක්ෂනාවරණයේ වලංගු භාවය ලියාපදිංචියේදී සැලකිල්ලට ගනු ලැබේ.

(වාහන ආයිත්තම් සඳහා වලංගු වේ )

8. මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීම , සේවා කිරීම . වීල් බැලන්ස් කිරීම හා වීල් එලයින්මන්ට්

සඳහා වන ගරාජ / සේවා සේථානයන්හි නවීන උපකරණ , පුහුණු සේවකයින්

සිටිය යුතුය.එසේම වාහන පහසුවෙන් නවතා තැබීමට ප්‍රමාණවත් ඉඩකඩද තිබිය යුතුය.